# සම්බුදු බල ආරක්ෂාව!

සම්මා සම්බුදු රජාණන් වහන්සේට මගේ නමස්කාරය වේවා!
දස පාරමී බලයෙන් උපන් සර්වඥාතා ඥානයට මගේ නමස්කාරය වේවා!
මම උතුම් ගෞතම සම්බුදු රජාණන් වහන්සේ සරණ ගියෙමි!
ඒ උතුම් ශ්‍රී සද්ධර්මයද, ආර්‍ය්‍ය මහා සංඝරත්නයද සරණ ගියෙමි!

සියළු බුදු රජාණන් වහන්සේලාගේ සර්වඥාතා ඥානයේ බලයෙන්,
මා වටා ඇති සියළු යන්ත්‍ර මන්ත්‍ර බන්ධන බිඳී යත්වා!
සියළු බුදු රජාණන් වහන්සේලාගේ සර්වඥාතා ඥානයේ බලයෙන්,
මා වටා ඇති සියළු නිව කුල බන්ධන බිඳී යත්වා!

සියළු බුදු රජාණන් වහන්සේලාගේ දස තථාගත බලයෙන්,
මා වටා ඇති සියළු ප්‍රේත දෝෂ, යක්ෂ දෝෂ, භූත දෝෂ දුරු වේවා!
සියළු බුදු රජාණන් වහන්සේලාගේ දස තථාගත බලයෙන්,
මා වටා ඇති සියළු ග්‍රහ දෝෂ, දේව දෝෂ, භූමි දෝෂ දුරු වේවා!
සියළු බුදු රජාණන් වහන්සේලාගේ දස තථාගත බලයෙන්,
මා වටා ඇති සියළු රෝගාබාධ, දුක් දොම්නස් දුරු වේවා!
සියළු බුදු රජාණන් වහන්සේලාගේ දස තථාගත බලයෙන්,
මා වටා ඇති සියළු සතුරු කරදර, විපත් දුරු වේවා!

සියළු බුදු රජාණන් වහන්සේලාගේ සතර විශාරද ඥානයේ බලයෙන්,
සියළු සතුට, සම්පත, ශීලය, ප්‍රඥාව මා කරා ලගා වෙත්වා!
සියළු බුදු රජාණන් වහන්සේලාගේ සතර විශාරද ඥානයේ බලයෙන්,
ලෝක පාලක සතර වරම් දෙවිරජුන්ගේ රැකවරණය මා කරා ලගා වෙත්වා!
සියළු බුදු රජාණන් වහන්සේලාගේ සතර විශාරද ඥානයේ බලයෙන්,
සියළු සම්‍යක් දෘෂ්ඨික බ්‍රහ්මයන්ගේ රැකවරණය මා කරා ලගා වෙත්වා!
සියළු බුදු රජාණන් වහන්සේලාගේ සතර විශාරද ඥානයේ බලයෙන්,
සියළු සම්‍යක් දෘෂ්ඨික දෙවියන්ගේ රැකවරණය මා කරා ලගා වෙත්වා!

සාදු සාදු සාදු!!!

## දිනපතා භාවිතයට උපදෙස්

පිරිසිදු වී තෙරුවන්ට මල්, පහන්, සුවඳ දුම් පූජා කර තෙරුවන් වැඳ
පන්සිල් ගෙන තුන් සූත්‍රය සජ්ජායනා කරන්න.
හැකිනම් අටානටිය සූත්‍රය හෝ පිරිත ද සජ්ජායනා කරන්න.
තමන් කළ පුණ්‍ය කර්ම කිහිපයක් මෙනෙහි කරන්න.
ඉන්පසු එම පිං සියළු දෙවියන්ට අනුමෝදන් කරන්න.
පිරිසිදු තැනක මෙම ආරක්ෂාව අවබෝධයෙන් තුන් වරක් සජ්ජායනා කරන්න.
සියළු බන්ධන දුරු වේ! අමනුෂ්‍යය කරදර ඉවත් වේ! සම්පත උදා වේ!
ධර්ම විස්තරය - මජ්ජිම නිකායේ මහා සිංහනාද සූත්‍රය.

තෙරුවන් සරණයි!

**LankaWisdom.com Dhamma Donation.**
**2008 © By S.P.B.M.Ranasinghe (2008-10-20)**
**www.lankawisdom.com**